**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුලි 25 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 842.25 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම සම්පූර්ණ මුදලම උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | |
|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** |
| | **රු.මිලියන** | **රු.මිලියන** |
| පුනරාවර්තන | 778.25 | 778.25 |
| මූලධන | 64.00 | 64.00 |
| **එකතුව** | **842.25** | **842.25** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 09 ක් හා දෙපාර්තමේන්තු 08 ක් විසින් එකතුව රු.මිලියන 1,540.17 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදී තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,522.58 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 17.59 ක් හෙවත් සියයට 1.14 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 58.00 | 50.50 | 38.00 | 43.83 | 170.00 | 153.36 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 574.25 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | වටිනාකම |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0089/000 | 7.62 |
| 6000/0000/00/0002/0119/000 | 0.35 |
| 6000/0000/00/0011/0599/000 | 300.00 |
| 6000/0000/00/0014/0013/000 | 9.11 |
| 6000/0000/00/0016/0067/000 | 208.21 |
| 6000/0000/00/0017/0020/000 | 4.83 |
| 6000/0000/00/0020/0011/000 | 44.13 |
| **එකතුව** | **574.25** |

## 2.4 විගණන නිරීක්ෂණය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, තවත් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල සාමාජිකයන්ගේ පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වාගෙන නොතිබුණි. |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |

### 3.2 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සුනාමියෙන් හානියට පත් නිවාස අළුත්වැඩියාවන් සඳහා 2014 වර්ෂයේදී රු.මිලියන 48.00 ක් ලැබී තිබුණි. එයින් රු.මිලියන 31.95 ක් අදාළ අරමුණ සඳහා වියදම් කර වර්ෂය අවසාන වන විට රු.මිලියන 16.05 ක් ඉතිරි වී තිබුණත් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. එම රඳවා ගත් තැන්පත්වලින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 14.85 ක් වැය කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 1.20 ක් අදාළ අරමුණ වෙනුවෙන් භාවිතා නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ආ) 2015 වර්ෂයේදී ව්‍යාපෘතියකට ගෙවීම සඳහා රු.969,539ක් වටිනා චෙක්පතක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබුණත්, ඉන් රු.270,234 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 27001දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.445,631ක් වූ අතර,එම හිඟහිටි ශේෂ මාස 06 ක සිට මාස 36 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, අයකර ගැනිමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ලබාදුන් රු.167,000 ක වටිනාකමක් සහිත ජල මෝටර 05ක් භාවිතයට නොගෙන වසර 11 ක කාලයක් මුළුල්ලේ නිෂ්ක්‍රීයව පැවැතුණි.

## 3.5 අනුකූල නොවීම්

**(අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 137 ට පටහැනිව වගකිව යුතු නිලධාරියෙකුගේ අනුමැතියකින් තොරව රු.424,838 ක් ගෙවා තිබුණි.

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

**කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බදු අයකර ගැනීම්**

අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරීමේදී එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වූ අක්‍රීය කොන්ත්‍රාත්කරුවන්ට පිළිවෙලින් රු.107,460 ක් සහ රු.192,852 ක වශයෙන් එකතුව රු.300,312 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි.

## 3.6 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|---|
| | | රු. | | |
| (i) | 2014 පළාත් නැගුම වැඩසටහන යටතේ මහඔය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය සඳහා පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | 2,876,790 | 2014.11.13 | මහඔය ප්‍රාදේශීය සභාවෙන් ඇති වූ විරුද්ධත්වයක් හේතුවෙන් ආරම්භ කර නොතිබුණි. |
| (ii) | 2014 වර්ෂය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පළාත් නැගුම වැඩසටහන යටතේ මහඔය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය අළුත්වැඩියා කිරීම. | 3,000,000 | 2014.11.11 | කොන්ත්‍රාත්තුකරුට . කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සිදුවූ ප්‍රමාදය නිසා ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. |
| (iii) | දින සියයේ විශේෂ සංවර්ධන වැඩසටහන යටතේ කල්මුණකුඩි 02 ප්‍රදේශයේ මධ්‍යම වෙරළ මාර්ගයේ වතුර බැසයාම සඳහා කාණු පද්ධතියක් ඉදිකිරීම. | 1,000,000 | 2015.08.25 | කොන්ත්‍රාත්කරුට ප්‍රදේශයේ ජනතාවගෙන් ඇතිවූ විරුද්ධත්වයක් නිසා ආරම්භ කර නොතිබුණි. |
| (iv) | දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගමනැගුම අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම යටතේ ස්වයං රැකියා සඳහා එළුවන් ලබාදීමේ ව්‍යාපෘතිය. | 500,000 | 2014.12.05 | අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තරම් කාලය ප්‍රමාණවත් නොවීම නිසා ක්‍රියාත්මක කර නොතිබුණි. |

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2015 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | |
| (i) | 2014 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මහඔය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය | 100,000 | 2014.08.20 | 49,138 | සමිතියේ පවතින මූල්‍ය අපහසුතාවයක් මත ක්‍රියාත්මක කර නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තුළ පිහිටි කළුපැණිබැද්ද පෙර පාසල් ගොඩනැගිල්ල හා මරණාධාර සමිති ගොඩනැගිල්ල ඉදිකිරීම. | | | | |
| (ii) | 2013 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩ සටහන යටතේ මහඔය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි ටැම්පිටිය විද්‍යාලයට ගුරු නේවාසිකාගාරයක් ඉදිකිරීම. | 2,620,112 | 2013.03.25 | 1,575,560 | ශ්‍රම දායකත්වයක් ලබාදීමට සිවිල් ආරක්ෂක බලකාය එකඟතාවයකට පැමිණ තිබුණද, නියමිත පරිදි ශ්‍රම දායකත්වය ලබාදීමට එම බලකාය අපොහොසත් වූ බැවින් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (iii) | 2017 ආසියානු ක්‍රීඩා උළෙලට සමගාමීව ග්‍රාමීය ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ මහඔය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වරාපිටිය විද්‍යාලයේ ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම. | 191,304 | 2014.11.20 | 13,300 | ක්‍රියාත්මක කිරීමේ ආයතනය වූ මහඔය කලාප අධ්‍යාපන කාර්යාලය විසින් මෙය අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. |
| (iv) | එක ගමකට එක වැඩක් 2014 වැඩසටහන යටතේ පදියතලාව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි මරංගල ප්‍රජා ශාලාව ඉදිකිරීම. | 980,000 | 2014.10.10 | 354,172 | 2015 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති ලැයිස්තුවට ඇතුළත් කර නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතියේ ඉතිරි කොටස් නිම කර නොතිබුණි. |

(ඇ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිම කළ දිනය | 2015 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | | | | රු. | |
| (i) | දමන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි කීනවත්ත විද්‍යාලයේ ඊ ශිල්පාගාරයක් ඉදිකිරීම. | 1,987,752 | 2014.11.20 | 2014.12.25 | 2015.12.28 | 1,708,258 | අධික වර්ෂාව හා අක්මුදල් ලැබීමේ ප්‍රමාදයන් නිසා ඉදිකිරීම් ප්‍රමාද වී තිබුණි. |
| (ii) | දමන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි දමන මහා විද්‍යාලයේ ඊ ශිල්පාගාරයක් ඉදිකිරීම. | 1,987,752 | 2014.07.21 | 2014.12.31 | 2015.12.28 | 1,609,141 | අධික වර්ෂාව හා, අක්මුදල් ලැබීමේ ප්‍රමාදයන් නිසා ඉදිකිරීම් ප්‍රමාද වි තිබුණි. |
| (iii) | මහඔය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි ඇහැලගස්පල්ලම කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම. | 200,000 | 2014.08.20 | 2014.11.20 | 2015.12.28 | 149,173 | ප්‍රමාණවත් මුදල් නොලැබීම් හා කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් ප්‍රමාද කිරීම |
| (iv) | මහඔය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය සංවර්ධනය. | 191,210 | 2014.11.20 | 2014.12.30 | 2015.12.26 | 191,210 | ඉඩම් පවරා ගැනීමේදී සිදුවූ ගැටළුකාරී තත්ත්වයන් නිසා ප්‍රමාද වී ඇත. |
| (v) | අම්පාර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සිත්සරණ | 2,860,665 | 2007 | නිම කළ යුතු දිනය සඳහන් කර | 2016.03.08 | 2,860,664 | සුදුසු ඉඩමක් තෝරාගැනීමේ පැවති ගැටළුකාරී |

| | | |
|---|---|---|
| උපදේශන මධ්‍යස්ථානය ඉදිකිරීම. | නොමැත | තත්ත්වය නිසා ප්‍රමාද වී තිබුණි. |

**3.7 කාර්යසාධනය**

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු කාර්යයන් කිහිපයක් අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

(අ) අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂය සඳහා කුකුළු පැටව් 6,552 ක් මිලදී ගැනීම සඳහා 2014 ඔක්තෝබර් 13 දින රු.1,964,650 ක් නැගෙනහිර පළාත් සභාවේ සත්ව නිෂ්පාදන අංශයට ගෙවා තිබුණි. 2015 දෙසැම්බර් 22 දින වන විටත් එම කුකුළු පැටව් ලබාගෙන නොතිබුණි.

(ආ) ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් පෙර පාසල් ළමුන් සඳහා කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන යටතේ දමන හා අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල පෙර පාසල් 88 ක් සුදුසුකම් ලැබුවද, පෙර පාසල් 19ක් සඳහා පමණක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි.

(ඇ) දින සියය විශේෂ සංවර්ධන වැඩසටහන යටතේ දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබූ පල්ලව්වේනෙයි ප්‍රධාන ඇළ මාර්ගය සඳහා පිටවාන් (Regulator) 02ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියනයක ප්‍රතිපාදන අනුමත වී තිබුණි. නිවැරදි ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණි.

**3.8 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් සම්බන්ධ සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උහන ගොනාගොල්ල උප තැපැල් කාර්යාලය ඉදිකිරීම සඳහා පළමු කොන්ත්‍රාත්කරු සමඟ රු.860,706 ක ඇස්තමේන්තු වටිනාකමකට ගිවිසුම්ගතවී රු.773,661 ක් ගෙවා තිබුණි. නමුත්, ඔහු අදාළ ව්‍යාපෘතිය අතහැරීම නිසා එහි ඉතිරි කටයුතු දෙවන කොන්ත්‍රාත්කරුවෙකුගෙන් ඉටුකරවා ගැනීමට රු.162,624 ක් ගෙවා තිබුණි. ඒ අනුව සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා නොගැනීම නිසා රු.75,579 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පළාත් නැගුම ප්‍රතිපාදන යටතේ අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.මිලියන 3.5 ක ප්‍රතිපාදනවලින් 2015 දෙසැම්බර් 23 දින වන විට

ළමා උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණි. එම ළමා උද්‍යානයේ කැඩී තිබූ කොන්ක්‍රීට් කණු 06 ක් කොන්ත්‍රාත්කරු විසින් නැවත අළුත්වැඩියා කර නොතිබුණු අතර උද්‍යානයද ප්‍රයෝජනයට ගැනීමට නොහැකි තත්ත්වයක පවතින බව ඒ සම්බන්ධව සිදු කළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

**3.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**ගැලපුම් කළයුතු ශේෂ**

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | එකතුව |
|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි 03 ට අඩු | |
| | | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | - | 315000 | 315000 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 202,773 | 689,907 | 892,680 |
| (iii) | හඳුනා නොගත් හර | 381,992 | 66,047 | 448,039 |

**3.10 අවිධිමත් ගනුදෙනු**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර රු.622,800ක වටිනා ලිපිද්‍රව්‍ය තොගයක් 2015 දෙසැම්බර් 31 දින වන විට මිලදී ගෙන තිබුණි.

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී රජයේ

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව 2015 වර්ෂයේදී රු.9,673,200 ක් වටිනා කොන්ත්‍රාත් 09 ක් බල ප්‍රදේශය තුළ පිහිටි සමිති සඳහා ප්‍රදානය නොකර අදාළ බල ප්‍රදේශයෙන් පිටත පිහිටි වෙනත් සමිති මඟින් ඉටුකරවා ගෙන තිබුණි.

## 3.11 පාඩු හා හානි

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් බිඳ දැමීමෙන් සිදුවී තිබුණු අලාභය රු.680,590 ක් ලෙස තක්සේරු කර තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි කටයුතු නිම කර නොතිබුණි.

## 3.12 අනාර්ථික ගනුදෙනු

ගර්භනී මාතාවන්ට පෝෂ්‍යදායී ආහාර ලබාදීමේ වැඩසටහන යටතේ 2015 වර්ෂය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරක් විසින් ආහාර මිලදී ගැනීම සඳහා සැපයුම්කරු සමඟ ගිවිසුම්ගතවූ සහ ගැසට් නිවේදනවල සඳහන් මිළ ගණන් අනුව ගෙවිය යුතු රු.4,352,760 ක් වී තිබුණත්, ඒ සඳහා රු.5,257,999 ක් ගෙවා තිබුණි. ඒ අනුව රු.905,239 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3.13 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව 2014 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌණතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2014 | 154(6) 3.1 | ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා නොතිබීම. |
| 2014 | 154(6) 3.5 | අත්තිකාරම් ගිණුම්වල හිඟහිටි ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| 2014 | 154(6) 3.6 | නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් |
| 2014 | 154(6) 3.9 | කැබ් රථයක් අළුත්වැඩියා නොකර වසර දෙකක් ගාල්කර තැබීම. |

## 3.14 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පැවති කැබ්රථයක් අළුත්වැඩියා කටයුත්තක් සඳහා 2013 නොවැම්බර් 06 වන දින ගරාජයකට යොමු කර ඇතත්, 2015 දෙසැම්බර් 08 දින වන විටත් එහි කිසිදු අළුත්වැඩියාවක් සිදුනොකර ගරාජයේ රඳවා තිබුණි.

(ආ) සමාජ සේවා අමාත්‍යාංශයේ 2015 ජනවාරි 06 දිනැති අංක NSPD/3/2015 දරන චක්‍රලේඛය ප්‍රකාරව ආබාධිත පුද්ගලයන් සඳහා ගෙවනු ලබන ආධාර මුදල් ඔවුන්ගේ බැංකු ගිණුම්වලට තැන්පත් කළ යුතු වුවත්, අක්කරපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,892,000 ක ගෙවීමක් මුදලින් කර තිබුණි.

(ඇ) අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු මෝටර් බයිසිකල් 03 ක් සඳහා පසුගිය වර්ෂ 04 ක් වෙනුවෙන් අදායම් බලපත්‍ර, රක්ෂණ සහතික ලබාගෙන නොතිබූ අතර, ඒවා සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන්ද පවත්වා නොතිබුණි.

(ඇ) පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දින කොන්ත්‍රාත් වැඩ සඳහා ලියන ලද රු.2,632,890ක් වටිනා චෙක්පත් 02 ක් අදාළ කොන්ත්‍රාත්කරුට නිකුත් නොකර අත රඳවාගෙන තිබුණු අතර, 2016 අප්‍රේල් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් ලෙස ද පෙන්වා තිබුණි.

(ඉ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පවතින යතුරුපැදි 02 ක් විධිමත් භාරදීමකින් තොරව 2008 වර්ෂයේ සිට සහකාර සැලැසුම් අධ්‍යාක්ෂක විසින් සහ 2014 වර්ෂයේ සිට පරිපාලන ග්‍රාම නිලධාරී විසින් භාවිතා කර තිබුණි.

(ඊ) මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ චෙක්පත් නිකුත් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු නිසා 2015 වර්ෂයේ මුල් මාස 08 තුළ රු.443,688 ක් චෙක්පත් 23 ක් සුදුසුකම් නොලද අයට චෙක්පත් ලිවීම සහ වෙනත් මුද්‍රණ දෝෂ හේතුවෙන් අවලංගු කර තිබුණි.

**3.15 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 88 | 83 | 5 | - |
| (ii) | තෘතියික මට්ටම | 41 | 11 | 30 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,201 | 1,041 | 160 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 214 | 231 | - | 17 |
| | **එකතුව** | **1,544** | **1,366** | **195** | **17** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රධාන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් වන සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතීම හා එම තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු නොකිරීම අදාළ බල ප්‍රදේශයන්හි ජනතාවට ප්‍රමාණවත් සේවයක් ලබාදීමට අහිතකර අන්දමින් බලපෑ හැකි බව නිරීක්ෂණය විය.

(ii) ප්‍රධාන වශයෙන් තාක්ෂණික නිලධාරි හා තාක්ෂණික සහයක තනතුරු 18 ක් පුරප්පාඩුව පැවතීම හා එම තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු නොකිරීම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කොන්ත්‍රාත් කටයුතු ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණ කටයුතු සතුටුදායක තත්ත්වයක නොපවතින බව නිරීක්ෂණය විය.